THE WORLD BANK
IBRD - IDA | WORLD BANKGROUP

PHSEP

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

# සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

# ප්‍රාථමික සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

# ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවාගැනීම

# ජ්‍යෙෂ්ඨ තාක්ෂණික නිලධාරී

ප්‍රාථමික සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (PHSEP), බැංකුව විසින් අරමුදල් සපයනු ලබන සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතියකි. ව්‍යාපෘතියේ මුළු පිරිවැය US$ මිලියන 150 ක් වන අතර, 2024 – 2028 කාල සීමාව සඳහා ශ්‍රී ලංකාවේ සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර සේවාවේ ප්‍රවේශය හා තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා එය සැලසුම් නිර්මාණය කොට ඇත.

ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ (PMU) ජ්‍යෙෂ්ඨ තාක්ෂණික නිලධාරී තනතුර පිරවීම සඳහා ශ්‍රී ලංකා පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. වැටුප (ඇමුණුම 02), පළපුරුද්ද සහ සුදුසුකම් (ඇමුණුම 01) හා වැඩි විස්තර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2026 පෙබරවාරි 02 දනම චක්‍රලේඛ අංක01/2026 මත පදනම් වේ.

| තනතුර | තනතුරු සංඛ්‍යාව | කාණ්ඩය (චක්‍රලේඛ අංක 01/2026 පරිදි) | සුදුසුකම් |
|---|---|---|---|
| **ජ්‍යෙෂ්ඨ තාක්ෂණික නිලධාරී** | 01 | E කාණ්ඩය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සිවිල් ඉංජිනේරු විද්‍යාව, ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳව හෝ අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධිය සමග අවම වශයෙන් වසර 4 ක අදාළ පළපුරුද්ද<br>හෝ<br>NVQ 7 වන මට්ටම සමග අවම වශයෙන් වසර 4 ක අදාළ පළපුරුද්ද<br>හෝ<br>NVQ 6 වන මට්ටම සමග අවම වශයෙන් වසර 9 ක අදාළ පළපුරුද්ද<br>හෝ<br>NVQ 5 වන මට්ටම සමග අවම වශයෙන් වසර 14 ක අදාළ පළපුරුද්ද<br>(NVQ සහතිකය, තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික හා වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කර තිබිය යුතුය) |

ව්‍යාපෘති විස්තර සඳහා කරුණාකර https://phsep.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

විස්තරාත්මක ජීව දත්ත සහිත අයදුම්පත් (නියමිත ආකෘතියක් නැත) අධ්‍යාපන, පළපුරුදු හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත් අමුණා, සම්බන්ධකරගත හැකි දුරකථන / ෆැක්ස් අංක / ඊමේල් ලිපිනය ඇතුළුව 2026 මාර්තු 05 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන පරිදි අයදුම්පත බහා එවනු ලබන කවරයේ වම් ඉහළ කෙළවරේ "**ජ්‍යෙෂ්ඨ තාක්ෂණික නිලධාරී තනතුර සඳහා අයදුම්පත**" යනුවෙන් සඳහන් කෙර පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් (පමණක්) එවිය යුතුය.

**ලිපිනය :**

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**ප්‍රාථමික සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (PHSEP),**
**191ඒ, "බංගලාව", ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය,**
**ධර්මපාල මාවත, කොළඹ 07.**
**ඊමේල් : info@phsep.lk**
**දුරකථනය : 0112271150**

අවශ්‍ය සුදුසුකම්, පළපුරුද්ද, නිපුණතා හා දක්ෂතාවයන් නොසපුරාලන, ප්‍රමාද හා අසම්පූර්ණ සහ ලිඛිත සාක්ෂි ඇතුළත් නොකොට ඇති, ලියාපදිංචි තැපැල් මගින් නොව වෙනත් ක්‍රමවේදයකින් (ඊමේල්, අතින් ගෙනැවිත් භාරදීම හෝ වෙනත් ලිපිනයකට යොමුකළ) ඉදිරිපත් කරන ලද අයදුම්පත් සලකා නොබලන අතර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**ප්‍රාථමික සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (PHSEP),**
**2026 පෙබරවාරි 19 වෙනි දින.**